පානම වන රක්ෂිතයේ වන සතුන් නැරඹීමට ගිය බ්‍රිතාන්‍ය සහ නෙදර්ලන්ත ජාතික සංචාරකයන් පිරිසකට, වන අලියකු කුලප්පු වී පහරදීමෙන් එම පිරිසේ සිටි බ්‍රිතාන්‍ය ජාතික සංචාරක කාන්තාවක් තුවාල ලබා රෝහල් ගත කිරීමේ සිදුවීම, දිවයින සහ දිනමිණ පුවත් වාර්තා වන් ඔස්සේ දැක්වී තිබුණේ මේ අයුරිනි.

1) විදෙස් ජාතිකයින්ව හැඳින්වීමට "සුද්දෝ" වැනි යෙදුම් සමාජය තුළ භාවිතා වුවත්, මාධ්‍ය තුළින් දිගින් දිගටම එවැනි සමේ වර්ණය පදනම් කරගනිමින් විදෙස් ජාතිකයින්ව හඳුන්වන යෙදුම් ප්‍රවර්ධනය කිරීම ඔස්සේ, එම විදේශකයන් කෙරෙහි යම්කිසි කොන් කිරීමේ ආකල්පයක් මුල්බැස නොගන්නේ ද?

2) "සුද්දෝ" වැනි යෙදුමක් වෙනුවට, විදෙස් ජාතිකයින්, විදෙස් සංචාරකයින් වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේද?

3) ඒ අනුව වඩාත් යෝග්‍ය වාර්තාකරණය ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමක්ද?

